
# සම්පත් පැතිකඩ
# 2025



## ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
## වදුරඹ

# පටුන


➢ **පළමු වන පරිච්ඡේදය** **පිටු අංක**

**1.හැදින්වීම** **8**

1.1 පිහිටීම 9

1.2 ග්‍රාම නිලධාරී වසම් 10 - 21

1.3 භූ විද්‍යාත්මක වැදගත්කම 22

1.4 භූ විෂමතාවය හා ජලවහනය 22

1.5 පස 23

1.6 බැවුම් කලාප 23

1.7 වර්ෂාපතන ව්‍යාප්තිය 24

1.8 කෘෂි පාරිසරික කලාප 24

1.9 ගංවතුරින් යටවන ප්‍රදේශ 25

1.10 පොලිස් බල ප්‍රදේශ 25

1.11 ගොවිජන කේන්ද්‍රස්ථාන 26

1.12 පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී කොට්ඨාස 27

1.13 රෙජිස්ටාර් කොට්ඨාස 28

1.14 සමෘද්ධි කලාප 29

1.15 මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාස 30

1.16 මැතිවරණ බල ප්‍රදේශ 31

1.17 වසම් වලට අයත් ගම් 32

➢ **දෙවන පරිච්ඡේදය**

**2. ජනගහනය, රැකිරක්ෂා හා ආදායම** **34**

2.1 ජන ව්‍යාප්තිය 34 -35

2.2 ජාතිකත්වය අනුව ජනගහනය 36

2.3 ආගම අනුව ජනගහනය 37

2.4 ජන ව්‍යාප්තිය වයස අනුව 38

2.5 අධ්‍යාපන මට්ටම අනුව ජනගහනය 39

2.6 ප්‍රදේශයේ දැනට පාසල් අධ්‍යාපනය ලබන ළමුන් සංඛ්‍යාව 40

2.7 කොට්ඨාසයේ විදේශගත පුද්ගලයින්ගේ සංඛ්‍යාව 41

2.8 වසමේ රාජ්‍ය නිලධාරීන් 42

2.9 සේවා නියුක්තිය 43

2.10 සේවා වියුක්තිය 44

2.11 වසමේ සිටින ශ්‍රම බලකාය 45

2.12 වයස අනුව රැකියා ව්‍යාප්තිය 46

2.13රැකියා නොමැති ශ්‍රම බලකාය 47

2.14 අංශ අනුව රැකියාවන්ගේ බෙදී යාම 48

2.15 වසමේ විදේශගත පුද්ගලයින් 49

➢ **<u>තුන් වන පරිච්ඡේදය</u>**

**3. පවුල් තොරතුරු** **50**

3.1 පවුලක මාසික ආදායම අනුව ජන ව්‍යාප්තිය 50

3.2 පවුල් තොරතුරු 51

3.3 නිවාස හා ඉඩම් තොරතුරු 52

3.4 සනීපාරක්ෂක පහසුකම් පිළිබඳ තොරතුරු 53

3.5 පානීය ජල පහසුකම් පිළිබඳ තොරතුරු 54

3.6 වහලේ ස්වභාවය 55

3.7 බිත්ති වල ස්වභාවය 56

3.8 ගෙබිම 57

3.9 විදුලි පහසුකම් පිළිබඳ තොරතුරු 58

3.10 දුරකතන පහසුකම් පිළිබඳ තොරතුරු 59

3.11 ඉඩම් අයිතිය පිළිබඳ තොරතුරු 60

3.12 ඉඩමේ ස්වභාවය පිළිබඳ තොරතුරු 61

3.13 මුළු භූමි ප්‍රමාණය 62

➢ **<u>හතර වන පරිච්ඡේදය</u>**

**4. කෘෂිකාර්මික තොරතුරු** **64**

4.1 වී වගා භූමි ප්‍රමාණය 64

4.2 මුළු වැවිලි භෝග භූමි ප්‍රමාණය 65

4.3 වැවිලි සමාගම් සතු වැවිලි වගා භූමි ප්‍රමාණය 66

4.4 වගාවන් සිදු කර ඇති භූමි ප්‍රමාණය පිළිබඳ තොරතුරු 67- 69

4.5 එළ ගව පාලනය 70

4.6 මී ගව පාලනය 71

4.7 එළු පාලනය 72

4.8 කුකුළු පාලනය 73

➢ **<u>පස් වන පරිච්ඡේදය</u>**

**5. යටිතල පහසුකම් හා සංවර්ධන ව්‍යාපෘති** **75**

5. සංවර්ධනය කරන ලද මාර්ග සම්බන්ධ තොරතුරු 75

5.2 වෙනත් ව්‍යාපෘති 76 -77

5.3 සංවර්ධනය විය යුතු මාර්ග 78-80

➢ **<u>හයවන පරිච්ඡේදය</u>**

**6. වාරිමාර්ග හා ජලජීවී** **82**

6.1 වාරිපහසුකම් පිළිබඳ තොරතුරු 82

6.2 විසිතුරු මත්ස්‍ය වගාව 83

➢ <u>හත් වන පරිච්ඡේදය</u>

**7. සංවිධාන තොරතුරු** **85**

7.1 ලියාපදිංචි ග්‍රාම සංවර්ධන සමිති 85-86

7.2 කොට්ඨාසයේ ලියාපදිංචි වැඩිහිටි සමිති 87

7.3 අවමංගලාධාර සමිති 88

7.4 කොට්ඨාසයට අයත් යෞවන සමාජ 88

7.5 කොට්ඨාසයේ ළමා සමාජ 89

7.6 ලියාපදිංචි /ප්‍රතිසංවිධානය කරන ලද ක්‍රීඩා 89-90

7.7 සමෘද්ධි පුජා මූල සමිති 91-92

7.8 ගොවි සමිති 93

7.9 ලියාපදිංචි කාන්තා සමිති 94

7.10 ලියාපදිංචි ස්වේච්ඡා සමාජ සේවා/රාජ්‍ය නොවන සංවිධාන 95-96

➢ <u>අට වන පරිච්ඡේදය</u>

**8. පොදු ආයතන හා අධ්‍යාපන ආයතන තොරතුරු** **98**

8.1 කොට්ඨාසයේ පවතින පොදු ආයතන 98-99

8.2 මූල්‍ය ආයතන තොරතුරු 100

8.3 බලශක්තිය හා සන්නිවේදනය 101

8.4 කොට්ඨාසයේ පාසල් සම්බන්ධ තොරතුරු 102

8.5 කොට්ඨාසයේ පෙර පාසල් සම්බන්ධ තොරතුරු 103

8.6 ජීව වායු ඒකක පිළිබඳ තොරතුරු 103

8.7 කොට්ඨාසයේ ළමා නිවාස 104

8.8 කොට්ඨාසයේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන 104

➢ <u>නව වන පරිච්ඡේදය</u>

**9. ප්‍රවාහන හා යටිතල** පහසුකම් **106**

9.1 වසමේ ඇති මෝටර් වාහන සංඛ්‍යාව 106

9.2 වසමේ ඇති වෙළෙඳ ආයතන 107

9.3 කොට්ඨාසයේ ලියාපදිංචි වී ඇති රථවාහන 108

- **<u>දහ වන පරිච්ජේදය</u>**

| | |
|---|---|
| **10.වෙනත් තොරතුරු /නිලධාරී තොරතුරු** | **110** |
| 10.1 අත්‍යවශ්‍ය දුරකතන අංක නාමාවලිය | 110 |
| 10.2 දිස්ත්‍රික්කය තුල පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 111 |
| 10.3 වසම් වලට අයත් ග්‍රාම නිලධාරීන් පිළිබඳ තොරතුරු | 112 |
| 10.4 කොට්ඨාසයේ වසම් භාර ප්‍රජා සවිබල ගැන්වීමේ නිලධාරීන් තොරතුරු | 113 |
| 10.5 කෘෂිකර්ම පර්යේෂණ නිලධාරීන් පිළිබඳ තොරතුරු | 114 |
| 10.6 කොට්ඨාසයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් පිළිබඳ තොරතුරු | 115 |
| 10.7 කොට්ඨාසයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් පිළිබඳ තොරතුරු | 116 |

- **<u>එකොළොස් වන පරිච්ජේදය</u>**

| | |
|---|---|
| **11. ආගමික ස්ථාන හා පොදු පහසුකම්** | **118** |
| 11.1 කොට්ඨාසයේ දහම් පාසල් | 118 |
| 11.2 කොට්ඨාසයේ විහාරස්ථාන | 119-120 |
| 11.3 කොට්ඨාසයේ කෝවිල් | 121 |
| 11.4 කොට්ඨාසයේ පල්ලි | 121 |
| 11.5 තැපැල් හා උප තැපැල් කාර්යාල | 122 |
| 11.6 සෞඛ්‍ය පහසුකම් පිළිබඳ දත්ත | 122 |
| 11.7 කොට්ඨාසයේ බෙහෙත් ඔසු සැල් පිළිබඳ තොරතුරු | 122 |
| 11.8 ආයුර්වේද වෛද්‍යවරු පිළිබඳ තොරතුරු | 123 |

- **<u>දොළොස් වන පරිච්ජේදය</u>**

| | |
|---|---|
| **12. රජයේ ආධාර** | **125** |
| 12.1 සහනාධාර පිළිබඳ තොරතුරු | 125 |
| 12.2 වඳුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨායේ ආපදාවන් පිළිබඳ තොරතුරු | 126 |

- **දහතුන් වන පරිච්ඡේදය**

**13. විශේෂ ස්ථාන** **128**

13.1 විල්ගමු රජමහා විහාරය 129

13.2 ලේල්වල ගලපාත පුරාණ මහා විහාරය 130

13.3 කිරින්දලාහේන වැව 131

13.4 දොලහේන රක්ෂිතය 132

- **දාහතර වන පරිච්ඡේදය**

**14. කර්මාන්ත හා වෙනත් ව්‍යාපාර** **134**

14.1 කොට්ඨාසයේ කර්මාන්ත පිළිබඳ හැඳින්වීම 134

14.2 තේ කර්මාන්ත ශාලා 134

14.3 කොට්ඨාසයේ වතු තොරතුරු 135

14.4 ප්‍රදේශයේ ලියාපදිංචි ගල්කොරි 136

14.5 කොට්ඨාසයේ ක්‍රීඩාපිටි තොරතුරු 136

14.6 වෙනත් කර්මාන්ත 136

14.7 ව්‍යාපාරික ස්ථාන 137

14.8 ලී මෝල් තොරතුරු 137

14.9 ලියාපදිංචි පැල තවාන්කරුවන්ගේ විස්තර 137

14.10 වී මෝල් 138

14.11 ඉදල් නිෂ්පාදනය 138

14.12 කුකුල් ගොවිපළ 139

14.13 රූපවාහිනී හා ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියාව 139

14.14 මෝටර් වාහන සේවා 139

14.15 පාපැදි අලුත්වැඩියාව 139

14.16 මෝටර් ගරාජ් 140

14.17 රසකැවිලි නිෂ්පාදනය 140

14.18 මදුරු දැල් / මෙට්ට කවර 140

14.19 බාබර් සාප්පු 141

14.20 කුළුබඩු නිෂ්පාදන 141

14.21 බිම්මල් කර්මාන්තය 142

14.22 පොල්තෙල් කර්මාන්තය 142

14.23 කැටයම් කර්මාන්තය 142

14.24 කොන්ක්‍රීට් නිෂ්පාදන 143

14.25 පොල්කටු ආශ්‍රිත නිෂ්පාදන 143

14.26 විසිතුරු මසුන් 143

14.27 කොස් ආශ්‍රිත නිෂ්පාදන 144

14.28 ස්වර්ණාභරණ නිෂ්පාදන 144

14.29 වැල්ඩින් වැඩපළවල් 144

14.30 හෝටල් 144

14.31 රූපලාවන්‍ය මධ්‍යස්ථාන 144


➢ <u>**පහළොස් වන පරිච්ඡේදය**</u>

**15. පාසල් ප්‍රතිඵල තොරතුරු 146**

15.1 පාසල් වල උසස් පෙළ ප්‍රතිඵල සම්බන්ධ තොරතුරු 146

15.2 පාසල් වල සාමාන්‍ය පෙළ ප්‍රතිඵල සම්බන්ධ තොරතුරු 146

15.3 පාසල් වල ශිෂ්‍යත්ව ප්‍රතිඵල සම්බන්ධ තොරතුරු 146

# පළමු වන පරිච්ඡේදය

## 1. හැඳින්වීම

ගාල්ල යනු මුහුදට ඉතාමත් සමීපව පිහිටා ඇති ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ පිහිටි අගනගරයයි. එය යුනෙස්කෝ සංවිධානය විසින් ලෝක උරුම නගරයක් ලෙස නම් කර තිබේ. ගාලු වරාය ඉන්දියන් සාගරය තුළ පිහිටීම නිසාම ගාල්ල පුරාණයේ සිටම වෙළෙඳ නගරයක් ලෙස ප්‍රසිද්ධව පවතී. ගාල්ල දිස්ත්‍රික්කය තුල සුවිශේෂී ස්ථාන රාශියක් පිහිටා ඇත. විදේශික සිත් ඇඳ බැඳ ගන්නා සුළු ගාල්ල නගරය ඉතා අයස්කාන්ත සුළුය.

ගාල්ල නගරයෙන් කිලෝමීටර 18 ක් පමණ රට තුලට වන්නට වඳුරඹ නම් සුන්දර ගම්මානය පිහිටා ඇත. ගාලු දිසාවේ ග්‍රාම නිලධාරි වසම් 22 කින් හා පවුල් **8575** කින් ද සමන්විතව සොඳුරු පෙදෙසක පිහිටා ඇති වඳුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අතීතයේ පටන් ගහකොළ තුරුලතා වලින් ගහන වූත්, බුදුදහමේ ආශිර්වාදයෙන් හා කෘෂිකර්මාන්තයෙන් ස්වයංපෝෂිත වූ සොඳුරු මිනිසුන්ගෙන් පිරි ජීවත්වීමට සුදුසු වූ තෝතැන්නකි. ගාල්ල දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණයෙන් 2% ක් ( වඳුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වන අතර අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා සලකා බැලීමේදී විශාලත්වයෙන් දෙවන කුඩාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වේ.

වඳුරඹ කොට්ඨාසය ඉතා ඈත අතීතයකට හිමිකම් කියනු ලබන අතර පුරාණ පොත් පත් හා ග්‍රන්ථවලද ඒ බව සඳහන්ව වී ඇත. "වඳුරඹ" යනුවෙන් නම සැදී ඇත්තේ කෙසෙල් බහුල ප්‍රදේශයක වඳුරන් බොහෝ සේ ගැවසීම නිසා බව ප්‍රකට කියමනකි. මීට අමතරව "වඳුරඹ" නම සෑදීම වටා නොයෙක් කතා වස්තූන් හා කියමන්ද බැඳී පවතී.

අර්ධ නාගරික හා ග්‍රාමීය ජන ජීවිතයකින් හෙබි මෙම කොට්ඨාසයේ ප්‍රධාන ජීවනෝපාය වශයෙන් අතීතයේ පැවත ඇත්තේ වී ගොවිතැනය. අතීතයේ ප්‍රධාන ජීවනෝපාය වී ගොවිතැන වුවද වර්තමානයේ එය අභිබවා තේ වගාව මෙන්ම රබර්, පොල් සහ සුළු අපනයන බෝග ද පෙරමුණ ලබාගෙන ඇත. නමුත් වර්තමානයේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගයක් වශයෙන් තේ වගාවද හැඳින්විය හැකිය. මෙයට අමතරව රබර්, පොල්, කුරුඳු සහ සුළු අපනයන භෝග ද, ගෙවතු වගාව ද දැකිය හැකිය. එසේම වර්තමානයේ ප්‍රදේශයේ ප්‍රචලිත වෙමින් පවතින වගාවක් ලෙස ගෙවතු වගාව හඳුන්වා දිය හැකිය.

මෙම කොට්ඨාසයේ ප්‍රධාන ජල පෝෂකය වන්නේ කොට්ඨාසයේ මායිමෙන් සහ විටෙක කොට්ඨාසය මැදින් ගලා බස්නා ඇල අමුණු වේ. එමෙන්ම, නීල් ද අල්විස් මහතා විසින් නිර්මාණය කරන ලද කොට්ඨාසය මධ්‍යයේ පිහිටි අක්කර 5 ක පමණ වපසරියකින් යුතු කිරින්දලාහේන වැව ද කොට්ඨාසයේ සුන්දරත්වය වඩාත් ඔප් නංවයි. වැව මධ්‍යයේ පිහිටි අක්කරයක පමණ වපසරියකින් යුතු කුඩා දූපත කාගෙත් සිත් ඇඳ බැඳ ගන්නා සුළු අයස්කාන්ත ස්ථානයකි. එසේම වැව වටා බැඳි බන්ට් වේල්ල සංචාරක ආකර්ෂණය තවත් ඔප් නංවයි. මීට අමතරව ස්වභාව සෞන්දර්ය විඳගත හැකි බොහෝ ස්ථාන කොට්ඨාසය තුල පවතී.

එමෙන්ම මෙම කොට්ඨාසය තුළ පිහිටා ඇති අක්කර 64 ක වපසරියකින් යුතු දොළහේන රක්ෂිතය නිවර්තන වැසි වනාන්තර ඝනයට අයත්වේ. ග්‍රාම නිලධාරි වසම් තුනකට මායිම්ව පිහිටා ඇති අතර සුන්දරත්වය තවත් වැඩිකරමින් රක්ෂිතය මධ්‍යයෙන් දොල පාරක් ගලා බසී.

වඳුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පවතින ඓතිහාසික හා පුරා විද්‍යාත්මක ස්ථාන අතුරින් දඹදෙණි යුගයට අයත් **මාබොටුවන පුරාණ විල්ගමු රජමහා විහාරය** හා **ගලපාත පුරාණ රජමහා** විහාරය වැදගත් ස්ථානයක් හිමි කර ගනී. ඉතා මනස්කාන්ත පරිසරයකට හිමිකම් කියනු ලබන ගලපාත විහාරය හා පැරණි දේවාලය සංචාරකයින් සඳහා සිත් ඇඳ ගන්නා සුවිශේෂී ස්ථානයක් වේ.

පරිපාලනමය පහසුව උදෙසා මෙම කොට්ඨාසය බද්දේගම කොට්ඨාසයෙන් වෙන් කර 2021 වර්ෂයේ සිට ග්‍රාම නිලධාරී වසම් 22 කට බෙදා වෙනම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් ලෙස පාලනය කෙරේ. එම ග්‍රාම නිලධාරී වසම් 22 ද විවිධ ආයතනවල අවශ්‍යතාවයන් අනුව කොටස් වශයෙන් ගොනු කරගෙන ඇත. වඳුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පරිපාලන කටයුතු ප්‍රාදේශීය ලේකම්වරු කිහිපදෙනෙකු යටතේ ක්‍රියාත්මකව ඇත.

## 1.1 පිහිටීම (LOCATION)

ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ නිරිත දිග කොටසෙහි පිහිටි ගාල්ල දිස්ත්‍රික්කයේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22 අතුරින් වදුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගාල්ල නගරයට කි.මී. 18 ක් දුරින් වයඹ ගිනිකොණ දිශානුගතව පිහිටා ඇත.

මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය,

උතුරු අක්ෂාංශ $6^0$ - 5' හා $6^0$ - 10' අතර ද,

නැගෙනහිර දේශාංශ $80^0$-10' හා $80^0$ - 19' අතර ද, පිහිටා ඇත.

උතුරින් බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ද, නැගෙනහිරින් නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ද, දකුණින් අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ද, බටහිරින් බෝපේ-පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට ද මායිම් වේ.

වදුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වර්ග ප්‍රමාණ හෙක්ටයාර් 4500 ( වර්ග කිලෝමීටර් 45) කි. ගාල්ල දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණයෙන් 2% කි. එය කුඩාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතරින් එකක් ලෙස සැලකිය හැකිය.



## 1.2 . ග්‍රාම නිලධාරී වසම්


කුඩාම පරිපාලන ඒකකය වන ග්‍රාම නිලධාරී වසම් සැලකිල්ලට ගැනීමේදී විවිධ අවස්ථාවල වෙනස්වීම් සිදු වී ඇත. වඳුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් 22 වර්ග ප්‍රමාණ අනුව බලන විට කුඩාම ග්‍රාම නිලධාරී වසම කිරින්දලාහේන වන අතර එහි වර්ග ප්‍රමාණය හෙක්ටයාර් 70 කි. විශාලතම ග්‍රාම නිලධාරී වසම මාබොටුවන වන අතර වර්ග ප්‍රමාණය හෙක්ටයාර් 486 කි.

| අනු අංකය | ග්‍රාම නිලධාරී වසම් අංකය | ග්‍රාම නිලධාරී වසමේ නම | භූමි ප්‍රමාණය (හෙක්) | භූමි ප්‍රමාණය ($km^2$) |
|---|---|---|---|---|
| 1 | 186 ඒ | ඉදුරුපත්විල | 176 | 1.76 |
| 2 | 186 ඩී | වැයිහේන | 195 | 1.95 |
| 3 | 189 | මාබොටුවන | 486 | 4.86 |
| 4 | 189 ඒ | නාත්තෙවෙල | 305 | 3.05 |
| 5 | 189 බී | තලාව | 262 | 2.62 |
| 6 | 190 | ඉහළ ලේල්වල | 183 | 1.83 |
| 7 | 190 ඒ | කුඹලමලහේන | 114 | 1.14 |
| 8 | 190 බි | පංවිල | 88 | 0.88 |
| 9 | 191 | පහළ ලේල්වල | 193 | 1.93 |
| 10 | 191 ඒ | කොකාවල | 235 | 2.35 |
| 11 | 191 බී | පොල්ගහවිල | 136 | 1.36 |
| 12 | 191 සී | දෙයියන්දර | 115 | 1.15 |
| 13 | 191 ඩී | කිරින්දලාහේන | 70 | 0.7 |
| 14 | 200 | මැදකීඹිය | 172 | 1.72 |
| 15 | 200 ඒ | මැදකීඹිය නැගෙනහිර | 163 | 1.63 |
| 16 | 200 බී | පිටිහරාව | 271 | 2.71 |
| 17 | 200 සී | තිරුවානකැටිය | 202 | 2.02 |
| 18 | 207 | ඉහළ කීඹිය | 361 | 3.61 |
| 19 | 207 ඒ | ඉහළ කීඹිය දකුණ | 256 | 2.56 |
| 20 | 221 | වඳුරඹ උතුර | 167 | 1.67 |
| 21 | 221 ඒ | වඳුරඹ දකුණ | 185 | 1.85 |
| 22 | 221 බි | ගුළුගහකන්ද | 165 | 1.65 |
| **එකතුව** | | | **4500** | **45** |

(මූලාශ්‍රය: ගාල්ල දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය)


# 186 ඒ ඉඳුරුපත්විල ග්‍රාම නිලධාරී වසම

ඉඳුරුපත්විල ග්‍රාම නිලධාරී වසමේ ඓතිහාසික හා සංස්කෘතික පසුබිම සලකා බැලීමේදී යුධ සමයේ මෙම ඉඳුරුපත්විල හරහා යන ගැල්කරුවන් (යුධ සෙබලුන් රැගත්) ගිමන් නිවා ආහාර පාන ගැනීමට වසම තුළ තිබූ වැව අසල නතර වී යයි.එම අරුතින් ඉඳුල්පත්විල ලෙස හඳුන්වා ඇති අතර පසුකාලීනව එය ඉඳුරුපත්විල ලෙස වෙනස් වූ බව ජනප්‍රවාදයේ සඳහන් වේ. ඉඳුරුපත්විල වසම උතුරින් වැයිහේන ද, දකුණින් කිරින්දලාහේන ද, නැගෙනහිරින් පහල ලේල්වල ද, බටහිරින් පොල්ගහවිලට ද මායිම් වේ.





# 186 ඩී වැයිහේන ග්‍රාම නිලධාරී වසම

අතීතයේ හේන් හා වතු සඳහා භාවිතා වූ විශාල භූමි ප්‍රදේශයක් වූ අතර නියමිත කලට වැහි වැටුණු හේන වැහි හේන " වැයිහේන " යනුවෙන් සුබෝච්චාරණයේදී භාවිතා වී ඇත.




## 189 මාබොටුවන ග්‍රාම නිලධාරී වසම

මහා බටුවනයක් තිබූ බැවින් "මහාබටුවන" මාබොටුවන බවට ගැමි ව්‍යවහාරයත් සමඟ පරිවර්තනය වී ඇති බව ජනප්‍රවාදයේ සඳහන් වේ.




## 189 ඒ නාත්තවෙල ග්‍රාම නිලධාරී වසම


මගමුල්ල නම් ප්‍රදේශයේ නිධන් දොළ නමැති ස්ථානයට නා ගසක අත්තක් වැටීම හේතු කොට නාත්තෙවල ලෙස හැඳින් වූ බව ජනප්‍රවාදයේ සඳහන් වේ.



## 189 බී තලාව ග්‍රාම නිලධාරී වසම


කඳු වළල්ලකින් වට වූ තැනිතලා භූමිය තලාව නම් වූ බව ජනප්‍රවාදයේ සඳහන් වේ.

**90**





## ඉහළ ලේල්වල ග්‍රාම නිලධාරී වසම

අතීතයේ දවටගහදූව ප්‍රදේශයේ වලක් ආශ්‍රිතව ලේල්ලු නම් මාලු විශේෂයක් සිටි බැවින් "ලේල්ලුවල" ලේල්වල ලෙස ව්‍යවහාරයට පැමිණි බව පැරැන්නන්ගේ මතකයයි.



## 190 ඒ කුඹලමලහේන ග්‍රාම නිලධාරී වසම


කුඹල් පවුලක් මලාමුරේ හෙවත් මල්මුර කන්ද ප්‍රදේශයේ ජීවත් වී ඇති අතර එම පවුලේ ගෘහමූලිකයා හේනක මැටි ගෙයක් ඇතුලෙහි මිය ගොස් සිටීම හේතුවෙන් ''කුඹලාමලහේන'' ගැමි ව්‍යවහාරයත් සමඟ කුඹලමලහේන ලෙස පරිවර්තනය වී ඇති බව ජනප්‍රවාදයේ සඳහන් වේ.




190 බී


## පංවිල ග්‍රාම නිලධාරී වසම

විශාල ලෙස පන් වැවී තිබූ හීන්බද්දර නම් හැලක් තිබී ඇති අතර එම හැලේ ඇති පන් නෙලා ගෙන පන් ආශ්‍රිත නිෂ්පාදන සිදුකොට ප්‍රදේශයේ ජනතාව ජීවිකාව ගෙන ගොස් ඇත. එසේ නිෂ්පාදන සඳහා පන් නෙලා ගත් විල පන්විල වූ බව ජනප්‍රවාදයේ සඳහන් වේ.




## 191 පහළ ලේල්වල ග්‍රාම නිලධාරී වසම

හාදපානම දිලිසෙන ලෙහෙල්ලුන් නම් මාළු විශේෂයක් සිටි නිසා එම ලෙහෙල්ලුන්ගෙන් සමන්විත විල ලේල්වල වූ බව ජනප්‍රවාදයේ සඳහන් වේ.





## 191 ඒ කොකාවල ග්‍රාම නිලධාරී වසම

පිලගොඩ වැලි නමින් සුදු වතුකරුවන්ගේ සැලකිල්ලට බඳුන් වූ සරු බිමක් වන මෙම ග්‍රාමය තුළ කොකුන් සිටින වලක් පැවති නිසා ''කොකාවල'' නම ලැබී ඇති බව පැරැන්නෝ පවසති.



## 191 බී පොල්ගහවිල ග්‍රාම නිලධාරී වසම


ප්‍රධාන පාරට යාබද අතීතයේ විශාල පොල්වැටි 2 ක් තිබී ඇති අතර ඒ මැද මාළු අල්ලන විශාල විලක් තිබී ඇත. පොල් වැටියෙන් ජල පහරට ගසා ගෙන ආ පොල් ගෙඩියක් විල මැද පැලවී උස පොල් ගසක් සෑදී ඇත. උස පොල්ගසක් ඇති විල පසුකාලීනව පොල්ගහවිල ලෙස නම් වී ඇති බවට පැරැන්නන්ගේ අදහස විය.




191 සී


## දෙයියන්දර ග්‍රාම නිලධාරී වසම

ලේල්වල ගලපාත විහාරයේ දේවාලයේ ගල් උළුවස්සට අයත් දොර සඟවා තිබූ ස්ථානය දෙයියන්ගේ දොර හෙවත් දෙයියන්දර ලෙස හැඳින්වූ බව ජනප්‍රවාදයේ සඳහන් වේ.




## 191 ඩී කිරින්දලාහේන ග්‍රාම නිලධාරී වසම

අතීතයේ කිරිඳි ශාකය බහුල වශයෙන් ව්‍යාප්ත වී පැවති කඳු සහිත හේන් ප්‍රදේශය පසුකාලීනව කිරින්දලාහේන වශයෙන් නම් පටබැඳුනු බව ජනප්‍රවාදයේ සඳහන් වේ.





## 200 මැදකීඹිය ග්‍රාම නිලධාරී වසම

පුරාණයේ තාපසයකු මෙම ප්‍රදේශයේ සංචාරය කරන විට ගම මැද පිහිටි සශ්‍රීක කුඹුරු යාය දැක "කිමද හිය" යනුවෙන් අසා ඇති බවත් එසේ අසන ලද්දේ මෙවන් සශ්‍රික කුඹුරු තිබියදී යුද වැදීමට බිය විය යුතු නැති බැවින් "කිමද හිය" යන්න "කීහිඹිය" ලෙසත් පසු කලෙක කීඹිය වූ බවත් ජනවහරේ සඳහන් වේ. කල්ගතවෙත්ම පරිපාලනයේ පහසුව තකා කීඹිය කොට්ඨාසය ග්‍රාම නිලධාරී කොට්ඨාස පහකට වෙන් කර ගෙන ඇත. 200 මැදකීඹිය ග්‍රාම නිලධාරී වසම එසේ වෙන්කර ගත් එක් ග්‍රාම නිලධාරී කොට්ඨාසයකි.




## 200 ඒ මැදකීඹිය නැගෙනහිර ග්‍රාම නිලධාරී වසම

පරිපාලනයේ පහසුව තකා කීඹිය කොට්ඨාසය තුළින් වෙන් කර ගන්නා ලද තවත් ග්‍රාම නිලධාරී වසමක් ලෙස 207 ඒ මැදකීඹිය නැගෙනහිර ග්‍රාම නිලධාරී වසම හඳුනාගත හැක.





## 200 බී පිටිහරාව ග්‍රාම නිලධාරී වසම

ඉතා දුෂ්කර වූ අර්ථයෙන් පිටිසර අග පිටිහරාව ලෙස හඳුන්වා ඇත.එමෙන්ම ජනප්‍රවාදයේ_පිට+ අරාව_පිටිහරාව ලෙස භාවිතා වූ බවද පැවසේ. අරාව යනු දෙමළ භාෂාවෙන් දොළ ලෙස හඳුන්වා ඇත. පිටදොළ පිටිහරාව ලෙස භාෂා ව්‍යවහාරයත් සමඟ භාවිතා වූ බව ජනප්‍රවාද මතය වේ.




## <u>200 සී තිරුවානකැටිය ග්‍රාම නිලධාරී වසම</u>

මෙම ග්‍රාමය හරහා ගලායන ප්‍රධාන නුගය අසල ප්‍රදේශය හා ඉන් ඔබ්බට ඇල දෙපස ඇති පස්වල බහුල වශයෙන් තිරුවාන ගල් නිධි දක්නට ලැබීම හේතුවෙන් තිරුවානකැටිය නම ලැබී ඇති බව පැරැන්නන්ගේ අදහසයි.





## <u>207 ඉහළකීඹිය ග්‍රාම නිලධාරී වසම</u>

පරිපාලනයේ පහසුව තකා කීඹිය කොට්ඨාසය තුළින් වෙන් කර ගන්නා ලද තවත් ග්‍රාම නිලධාරී වසමක් ලෙස 207 මැදකීඹිය ග්‍රාම නිලධාරී වසම හඳුනාගත හැක.




## 207 ඒ ඉහළකීඹිය දකුණ ග්‍රාම නිලධාරී වසම

පරිපාලනයේ පහසුව තකා කීඹිය කොට්ඨාසය තුළින් වෙන් කර ගන්නා ලද තවත් ග්‍රාම නිලධාරී වසමක් ලෙස 207 ඒ ඉහළකීඹිය දකුණ ග්‍රාම නිලධාරී වසම හඳුනාගත හැක.





## 221 වඳුරඹ ග්‍රාම නිලධාරී වසම

කෙසෙල් ගස් බහුල ප්‍රදේශයක වඳුරන් නිරන්තරයෙන් කෙසෙල් කෑම අර්ථයෙන් වඳුරඹ නම බැඳුණු බව ජනප්‍රවාදයේ සඳහන් වේ.




## 221 ඒ වදුරඹ දකුණ ග්‍රාම නිලධාරී වසම

කෙසෙල් ගස් බහුල ප්‍රදේශයක වඳුරන් නිරන්තරයෙන් කෙසෙල් කෑම අර්ථයෙන් වදුරඹ නම බැඳුණු බවත් පරිපාලනයේ පහසුව තකා වදුරඹින් වෙන් කර ගන්නා ලද කොටසක් ලෙස වදුරඹ දකුණ වසම හඳුනාගත හැක.




## 221 බී ගුළුගහකන්ද ග්‍රාම නිලධාරී වසම

අතීතයේ විශාල බුළු ගසක් තිබීම නිසා ගුළුගහකන්ද යන නාමය පටබැඳී ඇති බව ජනප්‍රවාදයේ සඳහන් වේ.



## 1.3 භූ විද්‍යාත්මක වැදගත්කම (GEOGRAPHICAL SIGNIFICANCE )

වදුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ භූ විද්‍යාත්මක තොරතුරු විමසා බැලීමේ දී ප්‍රාග් කේම්බ්‍රිය යුගයට අයත් පාෂාණ වලින් නිර්මාණය වී ඇත.



| පාෂාණ වර්ගය | සංකේතය | ප්‍රතිශතය |
|---|---|---|
| චාකොනයිට්ස් | CH | 49 |
| මාබල්,ඩොලමයිට් සහ ග්‍රැනයිට් නයිස් | MDG | 14 |
| බයොටයිට් නයිස් හා හෝන් බ්ලෙන්ඩ් | BH | 10 |
| මෙටා අවසාදිත | UN | 27 |
| එකතුව | 100 | |

## 1.4 භූ විෂමතාවය හා ජලවහනය (TOPOGRAPHY AND DRAINAGE)

වදුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ භූ විෂමතාවය සලකා බලන විට නිරිතදිග පහත් බිම් කොටසට අයත් වේ.

මෙහි සඳහන් ග්‍රාම නිලධාරී වසම් කොකාවල අඩි 300, කිරින්දලාහේන අඩි 300, දෙයියන්දර අඩි 200, මාබොටුවන අඩි 300, තලාව අඩි 100, වදුරඹ උතුර අඩි 200 යනාදී ලෙස උන්නතාංශයන් දක්වයි. ඒ අනුව වදුරඹ කොට්ඨාසයේ ජලවහනය සලකා බැලීමේදී ජලාකාර ජලවහනයක් පෙන්නුම් කරයි. කොට්ඨාසයෙහි ප්‍රධාන ජල පෝෂක වන්නේ කොට්ඨාසය මැදින් ගලා බස්නා ඇල අමුණු වේ.



## 1.5 පස SOILS)

වදුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඊසාන හා නැගෙනහිර කොටසෙහි විශාල වශයෙන් ව්‍යාප්තව ඇත්තේ තද ලැටරයිට් සහිත රතු කහ පොඩ්සෝලික් සහ ක්වාට්ස් සහිත පසයි. ගඟ ආශ්‍රිත පහත් මිටියාවත්වල විශාල වශයෙන් අර්ධ හැල් පස හා දියළු මිශ්‍රිත පස දක්නට ලැබේ. වදුරඹ කොට්ඨාසයේ පාංශු ව්‍යාප්තිය පහත සදහන් කර ඇත.

| සංකේතය | පාංශු වර්ගය |
|---|---|
| A1 | අර්ධ හැල්පස හා දියළු මිශ්‍රිත පස |
| A2 | මිශ්‍ර දියළු පස සහිත හියුමික්ග්ලේ දියළු පස |
| A3 | දියළු මිශ්‍රිත පස |
| A4 | ලවණ ලැටරයිට් සහිත රතු කහ පොඩ්සෝලික් පස |
| B2 | තද ලැටරයිට් සහිත රතු කහ පොඩ්සෝලික් පස සහ ක්වාට්ස් සහිත රතු කහ පොඩ්සෝලික් පස |
| C1 | වර්ණක සහිත රතු කහ පොඩ්සෝලික් පස සහ රතු කහ පොඩ්සෝලික් |
| C2 | වර්ණක සහිත රතු කහ පොඩ්සෝලික් පස කැපී පෙනෙන තට්ටුව සහිත (කඳු සහ බාදිත ප්‍රදේශ) |
| C3 | හියුමික් ග්ලේ දියළු පස සහිත හැල් පස |

## 1.6 බෑවුම් කලාප (SLOPE CLASSES MAP)

මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මධ්‍යයට වන්නට දළ බෑවුම් ප්‍රදේශ පොල්ගහවිල ග්‍රාම නිලධාරී වසම් වලින් දක්නට ලැබීම සුවිශේෂී වේ.

0% - 8% අතර බෑවුම් කලාපයට අයත් විශාල ප්‍රදේශයක් දක්නට ඇත. මෙයට ප්‍රධාන හේතුව බස්නාහිර කොටස වෙරළ බඩ තැනිතලා ප්‍රදේශයට ආසන්න වීමයි.

8% - 16% අතර බෑවුම් කලාපයට අයත් ප්‍රදේශ ඇති වසම් ලෙස තිරිවානකැටිය, ඉහලකීඹිය, පිටිහරාව, පහළ ලේල්වල, කිරින්දලාහේන යන ග්‍රාම නිලධාරී වසම් දැක්විය හැක.

16% -30% අතර බෑවුම් කලාපයට අයත් ප්‍රදේශ ඇති වසම් ලෙස පොල්ගහවිල, ඉහළලේල්වල, වදුරඹ උතුර, නාත්තෙවෙල, පිටිහරාව යන ග්‍රාම නිලධාරී වසම් ඇතුලත් වේ.

තව ද බෑවුම් කලාපයට අයත් ග්‍රාම නිලධාරී වසම් ලෙස ගුළුගහකන්ද, මාබොටුවන හා තලාව යන ප්‍රදේශ දැක්වේ.

| ශ්‍රේණිය | බෑවුම් පන්තිය | ප්‍රතිශතය (%) |
|---|---|---|
| B | 8% - 16% | 8% |
| C | 16% - 30% | 10% |
| D | 30% - 60% | 2% |
| E | 60% | 1% |
| | **එකතුව** | **21%** |